# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1617/16 - 2009 සැප්තැම්බර් 01 වැනි අඟහරුවාදා - 2009.09.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.-බී.11/80 111

1980 අංක 26 දරන ආහාර පනත

1980 අංක 26 දරන ආහාර පනතේ 32 වන වගන්තිය යටතේ ආහාර උපදේශක කමිටුව විමසා සෞඛ්‍ය ආරක්ෂණ සහ පෝෂණ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

නිමල් සිරිපාල ද සිල්වා,
සෞඛ්‍ය ආරක්ෂණ සහ පෝෂණ අමාත්‍ය.

2009 ජූලි මස 28 දින,
කොළඹ,
සෞඛ්‍ය ආරක්ෂණ සහ පෝෂණ අමාත්‍යාංශයේ දී ය.

නියෝග

01. මේ නියෝග 2009 ආහාර (ප්‍රතිඔක්සිකාරක) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර 2010 මාර්තු මස 01 වැනි දින සිට බලාත්මක විය යුතුය.

02. මිනිස් පරිභෝජනය සඳහා වන යම් ආහාරයකට භාවිතා කිරීමේ කාර්යය සඳහා මෙහි (1) වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරන ලද ප්‍රතිඔක්සිකාරකයක් හැර කිසිදු ප්‍රතිඔක්සිකාරකයක් කිසිදු තැනැත්තකු විසින් ආනයනය කිරීම, විකිණීම, භාවිත කිරීම හෝ ප්‍රචාරය කිරීම නොකළ යුතු ය.

03. මේ නියෝගවල විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, යම් ප්‍රතිඔක්සිකාරකයක් අඩංගු යම් ආහාරයක් කිසිදු තැනැත්තකු විසින් නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, ගබඩා කිරීම, ප්‍රවාහනය. බෙදාහැරීම, භාවිතා කිරීම හෝ ප්‍රචාරය කිරීම නොකළ යුතු ය.

04 (මෙහි මින් මතු "නිශ්චිත ආහාරයක්" යනුවෙන් සඳහන් කරනු ලබන) මෙහි I වැනි උපලේඛනයේ II වැනි තීරයේ නිශ්චිතව සඳහන් කරන ලද ආහාරයක එහි I වැනි තීරයේ අනුරූපී සටහනේ නිශ්චිතව සඳහන් කරනු ලබන ප්‍රතිඔක්සිකාරකයක් (මෙහි මින් මතු "අවසරලත් ප්‍රතිඔක්සිකාරකයක්" යනුවෙන් සඳහන් කරනු ලබන) එහි III වැනි තීරයේ අනුරූපී සටහනේ නිශ්චිතව සඳහන් කරන ලද අනුප්‍රමාණයන්ට අනුව ඒ ආහාරයක හෝ ඒ මත පැවතිය හැකි ය.

එසේ වුව ද, ළදරුවන් සහ කුඩා ළමයින් සඳහා වන ආහාරයක් හෝ ඒ ආහාරයක් මත 1 වන උපලේඛනයේ 1 වැනි, 2 වැනි සහ 3 වැනි අයිතමවල නිශ්චිතව සඳහන් කරන ලද යම් ප්‍රතිඔක්සිකාරකයක් හෝ ඒවායේ සංයෝගයක් අඩංගු නොවිය යුතු ය.

05. මෙහි I වැනි උපලේඛනයේ නිශ්චිතව සඳහන් අවසරලත් ප්‍රතිඔක්සිකාරක දෙකක් හෝ ඊට වැඩි ගණනක් අඩංගු විය හැකි යම් නිශ්චිත ආහාරයක එම ප්‍රතිඔක්සිකාරකවල සම්මිශ්‍රණයක් අඩංගු විය හැක්කේ, ඒ ආහාරයේ ඒ එක් එක් ප්‍රතිඔක්සිකාරකයෙන් අඩංගුවීමට යෝග්‍ය උපරිම ප්‍රමාණය වශයෙන් ඒ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපරිම ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස, ඒ ආහාරයේ අඩංගුව පවතින ඒ එක් එක් ප්‍රතිඔක්සිකාරකවල ප්‍රමාණය දැක්වූ විට, එම ප්‍රතිශතවල එකතුව ලෙස ලැබෙන සංඛ්‍යාව සියය නොඉක්මවන්නේ නම් පමණකි.

1A - G 11657— 3330 (2009/09)

6\. (අ) යම් සංයුක්ත ආහාරයක් නිශ්චිත ආහාර එකක් හෝ ඊට වැඩි ගණනක් භාවිත කර සකස් කිරීමේ දී, එක් කරන ලද යම් ප්‍රතිඔක්සිකාරකයක් -

(i) ඒ සංයුක්ත ආහාරය සකස් කිරීමට භාවිත කරන ලද යම් නිශ්චිත ආහාරයක අඩංගු වී තිබිය හැකි නම් ; සහ

(ii) යම් නිශ්චිත ආහාරයකට අදාළව 1 වන උපලේඛනයේ 111 වන තීරයේ නිශ්චිතව සඳහන් කර ඇති අවසරලත් අනුපාතයට වඩා වැඩි නොවන අනුපාතයකින් ඒ සංයුක්ත ආහාරයේ අඩංගු වන්නේ නම්,

(ආ) යම් සංයුක්ත ආහාරයක් නිශ්චිත ආහාරයක් වන්නේ නම් සහ 1 වන උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව සඳහන් වන යම් අවසරලත් ප්‍රතිඔක්සිකාරකයකට අදාළ ව එහි 111 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති අනුපාතයට වඩා වැඩි නොවන අනුපාතයකින්, ඒ ප්‍රතිඔක්සිකාරකය එහි අඩංගු වන්නේ නම්,

ඒ සංයුක්ත ආහාරයේ ප්‍රතිඔක්සිකාරකයක් අඩංගුවීම, මේ නියෝගවල ඇතුළත් කිසිවකින් තහනම් කරනු නොලැබිය යුතු ය.

7\. කිසිදු තැනැත්තකු විසින්, මෙහි II වන උපලේඛනයේ (1) වන සහ (2) වන ඡේදවල ඇතුළත් නියමයන්ට අනුකූලවන ලේබලයක් සහිත බඳුනක මිස ආහාර සකස් කිරීමේ දී සංඝටකයක් ලෙස යොදා ගැනීම සඳහා (වෙනත් යම් ද්‍රව්‍යයක් හා මිශ්‍ර කරනු ලැබ ඇති යම් අවසරලත් ප්‍රතිඔක්සිකාරකයක් ඇතුළුව) යම් අවසරලත් ප්‍රතිඔක්සිකාරකයක් භාවිතා කිරීම හෝ ප්‍රචාරය කිරීම නොකළ යුතු ය.

8\. මේ නියෝගවල නිශ්චිතව සඳහන් කර ඇති අවසරලත් ප්‍රතිඔක්සිකාරකයක් එකතු කර ඇති ආහාරයක් අඩංගු සෑම ආහාර බඳුනක ම ලේබලයේ 2005 ජනවාරි මස 19 වන දින අංක 1376/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2005 ආහාර (ලේබල් කිරීමේ සහ ප්‍රචාරය කිරීමේ) නියෝගවල දක්වා ඇති ආකාරයේ ප්‍රකාශයක් අඩංගු විය යුතු ය.

9\. මේ නියෝගවල -

" ප්‍රතිඔක්සිකාරකය" යන්නෙන්, ආහාරවල මුඩු රසක් හෝ ඔක්සිකරණය මගින් රසයෙහි පරිහානියක් ඇති කිරීම ප්‍රමාද කරන, අඩු කරන හෝ වලක්වන ද්‍රව්‍යයක් අදහස් වන අතර ඊට ලෙසිතින්, ඇස්කෝබික් අම්ලය හෝ එහි ලවණ, ටොකෝෆෝරල් වර්ග, සිට්රික් අම්ලය හෝ පොස්පරික් අම්ලය ඇතුළත් නොවේ.

" ළදරුවන් " යන්නෙන් වයසින් මාස දොළහට අඩු ළමයින් අදහස් වේ ; සහ

" කුඩා ළමයින් " යන්නෙන් වයස අවුරුදු එක සහ තුන අතර ළමයින් අදහස් වේ.

## I වැනි උපලේඛනය

**නිශ්චිත ආහාර සඳහා යෙදිය හැකි අවසරලත් ප්‍රතිඔක්සිකාරක සහ ඒවා යෙදිය හැකි උපරිම ප්‍රමාණයන්**

| I වැනි තීරුව | | | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|---|---|
| | ප්‍රතිඔක්සිකාරකය | ජාත්‍යන්තර අංකන ක්‍රමය අනුව අංකය | ප්‍රතිඔක්සිකාරකය යෙදීමට අනුමත ආහාර වර්ග | උපරිමව යෙදීමට අනුමත ප්‍රමාණයන් ආහාරයේ කිලෝග්‍රෑමයට මිලිග්‍රෑම් වලින් |
| 1 | ප්‍රොපයිල් ගැලේට් | 310 | (අ) ආහාරයට ගත හැකි මේද සහ තෙල් වර්ග, මාගරින්, මේද ඇතිරුම්, සලාද සඳහා යොදන තෙල්, ඌරු තෙල් සහ පිසීමේ දී වෙන් වන සත්ත්ව තෙල් | 100 |
| | ඔක්ටයිල් ගැලේට් | 311 | | |
| | ඩොඩෙසයිල් ගැලේට් | 312 | | |
| | හෝ එහි මිශ්‍රණයක් | | | |
| | | | (ආ) අත්‍යවශ්‍ය තෙල් | 1000 |
| 2 | බියුට්ලේටඩ් හයිඩ්‍රොක්සි ඇනිසෝල් (BHA) | 320 | (අ) ආහාරයට ගත හැකි මේද සහ තෙල් වර්ග, මාගරින්, මේද ඇතිරුම්, සලාද සඳහා යොදන තෙල්, ඌරු තෙල් සහ පිසීමේ දී වෙන් වන සත්ත්ව තෙල් | 200 |
| | | | (ආ) අත්‍යවශ්‍ය තෙල් | 1000 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3 | ටර්ට්-බියුටයිල් හයිඩ්‍රොක්විනෝන් (TBHQ) | 319 | (අ) | ආහාරයට ගත හැකි මේද සහ තෙල් වර්ග, මාගරින්, මේද ඇතිරුම්, සලාද සඳහා යොදන තෙල්, ඌරු තෙල් සහ පිසීමේ දී වෙන් වන සත්ත්ව තෙල් | 200 |
| | | | (ආ) | අත්‍යවශ්‍ය තෙල් | 1000 |
| 4 | ඇස්කෝබිල් පාමිටේට්/ ඇස්කෝබිල් ස්ටියරේට් | 304 305 | (අ) | ආහාරයට ගත හැකි මේද සහ තෙල් වර්ග, මාගරින්, මේද ඇතිරුම්, සලාද සඳහා යොදන තෙල්, ඌරු තෙල් සහ පිසීමේ දී වෙන් වන සත්ත්ව තෙල් | නිෂ්පාදන අවශ්‍යතාවය මත. |
| | | | (ආ) | අත්‍යවශ්‍ය තෙල් | |

## II වැනි උපලේඛනය

(1) 7 වන නියෝගය අදාළ වන්නා වූ එක් එක් බඳුන මත ලේබලයේ ප්‍රකාශනයක් මුද්‍රණය කර තිබිය යුතු අතර, එම ප්‍රකාශනයේ -

*(අ)* අඩංගු එක් එක් අවසරලත් ප්‍රතිඔක්සිකාරකයේ, පොදු හෝ සාමාන්‍ය නාමය හෝ එවැනි එක් එක් ද්‍රව්‍යයේ ජාත්‍යන්තර අංකන ක්‍රමය (INS) අනුව යෝග්‍ය අංකය සහ බඳුන තුළ වූ සම්මිශ්‍රණයේ දී පවතින එක් එක් සහ සියලු ප්‍රතිඔක්සිකාරකවල ප්‍රතිශතය;

*(ආ)* වෙනත් යම් ද්‍රව්‍යයක් අඩංගු වන අවස්ථාවක දී එවැනි එක් එක් ද්‍රව්‍යයේ පොදු හෝ සාමාන්‍ය නම හෝ ජාත්‍යන්තර අංකන ක්‍රමය (INS) අනුව යෝග්‍ය අංකය ; සහ

*(ඇ)* ද්‍රව්‍ය දෙකක් හෝ ඊට වැඩි ගණනක් අඩංගු වන්නේ නම් එක් එක් අවසරලත් ප්‍රතිඔක්සිකාරක ප්‍රමාණය සහ සම්මිශ්‍රණයේ පවතින එක් එක් වෙනත් ද්‍රව්‍යවල ප්‍රතිශතය.

(2) 1 වන ඡේදය ප්‍රකාරව අවශ්‍ය වන ඕනෑම ප්‍රකාශනයක -

*(අ)* පැහැදිලි හා පහසුවෙන් කියවිය හැකි විය යුතු ය;

*(ආ)* බඳුනේ සුරක්ෂිතව අලවා ඇති ලේබලයේ කැපී පෙනෙන ස්ථානයක පිහිටා තිබිය යුතු අතර, සාමාන්‍ය තත්ත්වයක් යටතේ ආහාර මිලදී ගැනීමට අදහස් කරන ගැනුම්කරුවකුට පහසුවෙන් තේරුම්ගත හැකි සහ කියවිය හැකි ආකාරයකට තිබිය යුතු ය;

*(ඇ)* වෙනත් යම් දෙයකින් සඟවනු ලැබ හෝ නොපැහැදිලි ලෙස දර්ශනය වන පරිදි හෝ නොතිබිය යුතු ය.

*අවලංගු කිරීම.-* 1993 ඔක්තෝබර් මස 14 වැනි දින අංක 788/7 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පලවූ 1993 ආහාර (ලේබල් කිරීම හා විවිධ) නියෝගවල III වන කොටසෙහි පලවූ අංක 27 හා 28 රෙගුලාසි සහ පස්වන උපලේඛනය මෙයින් අවලංගු කරනු ලැබේ.

09-558

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.